# සන්නස

**සංස්කරණය**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සංස්කරණ සහය**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage
අසෝක සුබසිංහ Asoka Subasinghe

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ආචාර්ය විද්‍යානි මනතුංග
ශ්‍රියාණි මද්දුමගේ
චන්දි මාපා
මහින්ද දිසානායක දිවුල්ගනේ
ශ්‍රියා කුමාරසිංහ

පිටු සැකසුම/ග්‍රැෆික් නිර්මාණ
ජගත් ජේ එදිරිසිංහ
Page Layout & Graphic Designs
Jagath J Edirisinghe

**සම්බන්ධීකරණය**

| | |
|---|---|
| **NSW** Lakshman Kodituwakku 02 9626 7660 02 9837 5055 | **WA** Kapila Hemantha Balage 08 9456 1972 |
| **QLD** Ananada Samaratunga 07 3372 7953 | **ACT** Asoka Nimalasiri 0439 925 241 |
| **SA** Chandta Eeriyagama | **TAS** Anura Seneviratne 03 6327 4259 |

**Sannasa**
22 Lorne Street
Lalor Vic 3075 Australia
**Web: www.sannasa.net**
email : info@sannasa.net
sannasa@gmail.com
Tel/Fax : 03 9402 5380


පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත


**අපේ ලිපිනය**
22 Lorne Street
Lalor Vic 3075 Australia
Tel/Fax : 03 9402 5380


## සංස්කාරක සටහන

සන්නස පුවත්පත විවෘත වේදිකාවකි. සන්සේ පළවන ලිපි වල අන්තර්ගත වන්නේ එම ලිපි ලියන ලේඛකයනගේ අදහස් ය. ඒ ලිපි තුළින් කතා බහ කෙරෙන කාරණා පිළිබඳව ඔබට ද මතයක් ඇත්නම් ඔබේ අදහසට ද ඉඩක් ලබා දෙන්නට අපි සැමවිටම උත්සාහ කරන්නෙමු. ඔබේ ලිපිය **ඉතා කෙටියෙන්** ලියන්න. පුවත් පතේ ඉඩ, අදහස නිරවුල් ව ඉදිරිපත් නොකිරීම, වැරදි සිංහල, වැනි හේතු මත සියලුම ලිපි සංස්කරණයට භාජනය විය හැකි බව සළකන්න.



# හෙට....?

**ශ්‍රී ලාල් ප්‍රියන්ත**

ශ්‍රී ලංකා දේශපාලන ක්ෂේත්‍රය ගොඩනැගී ඇත්තේ කපටිකමෙන් හා කෛයිරාටික කමෙන් උපාය උපක්‍රම භාවිතා කර තම අභිප්‍රායයන් ඉෂ්ට කර ගැනීමට උපන් හපන්කම් ඇති දේශපාලකයන් ජීවත් වන භූමියක් ලෙසය. මෑත ඉතිහාස දේශපාලන භූමිය දෙස ආපසු හැරී බැලීමේදී එය මනාව පසක් වේ. හිටපු ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩානායක කුමාරතුංග මහත්මියගේ හා වත්මන් ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ දේශපාලන කැඩපත ඊට හොඳම නිදසුන්ය. සිනාවෙන් හෝ කතාවෙන් බෑ මනින්නට මිනිසා යනුවෙන් මොහිදින් බෙග් ශූරීන් සිය ගීතයක් හරහා ප්‍රකාශ කර තිබුණත් චන්ද්‍රිකා බණ්ඩාරනායක හා මහින්ද රාජපක්ෂ සිනාවෙන් හා කතාවෙන් විවිධ බලවේග තමන් වෙත දිනාගෙන වැඩ ගැනීමට සහජ දක්ෂතාවක් හා හැකියාවක් ඇති දේශපාලන සත්ත්වයන් දෙදෙනෙකි. ජනතා විමුක්ති පෙරමුණ හිතන්නේ තමන්ව රැවටීමට කිසිම දේශපාලකයෙකුට හෝ පුද්ගලයෙකුට හෝ සංවිධානයකට බැරි බවය. නමුත් ජ.වි.පෙ. රවටා තමන්ට අවශ්‍ය වැඩ කොටස කර ගැනීමට චන්ද්‍රිකා සහ මහින්ද සමත් වූ බව අප කිසිවිටකත් අමතක නොකළ යුතුය.

ජ.වි.පෙ. එදා පටන්ම චන්ද්‍රිකාට හෝ මහින්දට කැමැති නැත. චන්ද්‍රිකා සහ මහින්දත් එසේය. ඔවුන් දෙදෙනා කිසිම විටක ජ.වි.පෙ. හෝ ඔවුන්ගේ ප්‍රතිපත්තිවලට කැමැති නැත. එම දෙපාර්ශ්වයේ ප්‍රතිපත්ති හා දේශපාලන අරමුණු හා භාවිතයන් අහසට පොළොවසේය.
එවැනි දේශපාලන හා සමාජ පසුබිමක් යටතේ චන්ද්‍රිකා හා ජ.වි.පෙරමුණත් මහින්ද හා ජ.වි. පෙරමුණත් අවස්ථා දෙකකදී වරින් වර ගිවිසුම් ගසා එකට සන්ධාන ගත වූයේ ඇයි ! එය පොදු අරමුණක් වෙනුවෙන්ද! එසේ නැත්නම් පෞද්ගලික අභිප්‍රායක් වෙනුවෙන්ද! යන්න විමසා බැලීම වටී.
චන්ද්‍රිකා, මහින්ද, ජ.වි.පෙ. තුන් කට්ටුව"පොදු අරමුණ" යන සංකල්පයට මුවා වී සන්ධාන ආණ්ඩු අටවා ගත්තේ තම තමන්ගේ දේශපාලන ව්‍යාපෘතිය තරකර ගැනීමට මිස "පොදු අරමුණක්" වෙනුවෙන් රටේ සුබ සිද්ධිය උදෙසා කටයුතු කිරීමට නොවන බව මේ වනවිට සන්ධාන ආණ්ඩුව කඩා වැටී ඔවුනොවුන් අතර ඇති වී තිබෙන විරසකවීම් හරහා මනාව පසක් වේ.

### චන්ද්‍රිකා, මහින්ද, සෝමවංශ දීගය.

චන්ද්‍රිකා හා මහින්ද යුවළ ගෙන් සැදුම්ලත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සෝමවංශ අමරසිංහගේ නායකත්වයෙන් යුත් ජ.වි.පෙ.සමග ගිවිසුම් ගසා එකතුවීමත් සමඟ ප්‍රතිවිරුද්ධ දේශපාලන විවේචකයන්ද ඒ දෙස බැලුවේ එතරම් සුබවාදී ආකල්පයකින් නොවේ. බොහෝ දේශපාලන විවේචකයන් ප්‍රකාශ කර සිටියේ මේ සන්ධාන ගතවීම හරහා ජ.වි.පෙ. ශ්‍රී.ල.නි.ප.ය දියකර හැරීමට උත්සාහ කරන බවය. තවත් සමහරු ප්‍රකාශ කර සිටියේ ජ.වි.පෙ. උපක්‍රමිකව තමන්ගේ ගොඩ වැඩි කර ගැනීමට ක්‍රියා කරමින් සිටින බවය. හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මියගේ ආණ්ඩු සමඟ 2004 වර්ෂයේදී ජ.වි.පෙ. ගිවිසුම් ගසා එක්සත් ජනතා නිදහස් සන්ධානය පිහිටුවා එළඹි මහ මැතිවරණයෙන් ජ.වි. පෙරමුණෙන් ගොඩ වැඩි වූ බව කව්රුත් දන්නා කරුණකි. එමගින් ජ.වි. පෙරමුණේ පාර්ලිමේන්තු මන්ත්‍රීධුර සංඛ්‍යාව 41 ක් දක්වා ඉහළ නැග්ගේය. ඉන් දෙකක් පසුව ජ.වි.පෙ. ශ්‍රී.ල.නි.ප.යට පූජා කළේය. එම පූජා කිරීම එක් පැත්තකින් එතරම් අසාධාරණ නැත. එය අල්ලසක් ලෙස හැඳින්වූවාට වරදක් ද නැත. මන්ද, එදා ජ.වි.පෙ. සන්ධාන ගත නොවී මහ මැතිවරණයට ඉදිරිපත් වුණේ නම් මෙතරම් මන්ත්‍රීධුර සංඛ්‍යාවක් ලබා ගැනීමට බැරිය. සන්ධාන ගතවී මැතිවරණයට ඉදිරිපත්වීම ශ්‍රී.ල.නි.පයේ පාර්ලිමේන්තු ආසන පසු බැසීමට හා ජ.වි.පෙරමුණේ මන්ත්‍රී ධුර ඉහළ යාමට හේතු විය.
එවැනි තත්ත්වයක් තුළ සන්ධාන ගත වී ගොඩවැඩි කර ගැනීමට සහාය පළ කළාට ජ.වි.පෙ. තමන්ට හිමි මන්ත්‍රීධුරවලින් දෙකක් ශ්‍රී.ල.නි.ප.යට පූජා කළාට එතරම් දොසක් දකින්නට බැරිය. එය තමන්ට කළ උපකාරයක් වෙනුවෙන් කෘතගුණ සැලකීමක් වනු ඇත.
මේ හරහා චන්ද්‍රිකාගේ නායකත්වයෙන් පිහිට වූ සන්ධාන ආණ්ඩුවේ ඇමැතිධුර 04 ක් සහ නියෝජ්‍ය ඇමැති ධූර 04 ක් ලබා ගෙන ජ.වි.පෙ. ශ්‍රී ලංකාවේ ප්‍රථම වතාවට අමාත්‍ය මණ්ඩලය නියෝජනය කිරීමට පවා වාසනාව උදාකර ගත්තේය.
නමුත් පසුව ජ.වි.පෙ. සියලු ඇමැති ධුරවලින් සහ රජයේ වගකීම්වලින් ඉවත් වී පාර්ලිමේන්තුව තුළ ස්ථාපිතව ක්‍රියා කිරීමට පටන් ගත්හ. ඒ උතුරු නැගෙනහිර පළාත කේන්ද්‍ර කරගෙන එදිනෙදා පිහිට වූ සුනාමි ප්‍රතිසංස්කරණ මණ්ඩලයට විරෝධය පළ කරමිනි. සුනාමි මණ්ඩලය අහෝසි කරන ලෙස ජ.වි.පෙ. චන්ද්‍රිකා ආණ්ඩුවට දිගින් දිගටම බලපෑම් එල්ල කළේය. එහි තිබෙන බරපතලකම ජ.වි.පෙ. ආණ්ඩුවට පෙන්වා දුන්නේය. ඒත් ඒ පිළිබඳව නිසි අවධානය යොමු නොකිරීම නිසා අවසානයේ ජ.වි.පෙ. ආණ්ඩුවෙන් ඉවත්වීම සිදුවිය.
ජ.වි.පෙ. සුනාමි ප්‍රතිසංස්කරණ මණ්ඩලය පිළිබඳව දැරූ ස්ථාවරයේ කිසිදු වරදක් නැත. එවැනි මණ්ඩලයක් හරහා සිදුවන්නේ තව තවත් කොටි සංවිධානය සිය බලය උතුරු නැගෙනහිර පළාත තුළ ශක්තිමත් කර එය ජාත්‍යන්තර ප්‍රජාවගේ පිළිගැනීමට ලක්වන තැනට රැගෙන යෑමට ක්‍රියා කිරීමය. එබැවින් චන්ද්‍රිකා දැනුවත්ව හෝ නොදැනුවත්ව එම මණ්ඩලය පිහිටුවීම හරහා කළේ බරපතළ වරදකි. එම වරද පසුව නීතිය හරහා නිවැරදි කිරීමට හැකිවීම කාගේ කාගේත් අනාගත සුබ සිද්ධියට හොඳ අඩිතාලමක් විය.

චන්ද්‍රිකා තමන්ගේ පක්ෂයේ අය පමණක් නොව එ.ජා.ප.යේ, ජ.වි.පෙ. හා වෙනත් දේශපාලන පක්ෂ වල අය පවා සිනාවෙන් කතාවෙන් හා දේහධාරී රූපයෙන් තමන් වෙත නම්මා ගෙන සිය කාරිය ඉෂ්ට සිද්ධ කර ගැනීමට උපන් හපන්කම් ඇති දේශපාලන චරිතයකි.
2001 දෙසැම්බර් මස 05 වැනිදා පැවති මහ මැතිවරණයෙන් රනිල් වික්‍රමසිංහ මහතාගේ නායකත්වයෙන් යුත් එ.ජා.ප. ය බලයට පත්වීමත් සමඟ චන්ද්‍රිකාට උදාවූනේ එතරම් හොඳ කාල පරිච්ඡේදයක් නොවේ. ඇයට ඉතාම කටුක අත්දැකීම්වලට මුහුණ පෑමට සිදු වූවාය.
එක් පැත්තකින් කොටින්ගේ තර්ජනය. අනෙක් පැත්තෙන් එ.ජා.ප.යේ කැපිලි කෙටිලිය. ඉන් බේරීම උදෙසා ඇයට සිය පක්ෂයේ අය සහ ජ.වි.පෙ. සමඟ එකතු වී එ.ජා.ප.යට විරුද්ධව දැඩි ප්‍රහාරයකට යෑමට සිදුවූවාය. එහිදී ඇයට ජ.වි.පෙ. ලැබූ පිටිවහල ඉතා විශාලය.
අවසානයේ ඇය වසර දෙකක එ.ජා.ප. ආණ්ඩුව විසුරුවා හැර ජ.වි.පෙ. සමඟ සන්ධාන ගත වී අලුත් ආණ්ඩුවක් පිහිටුවා ගිලිහී ගොස් තිබූ බලය යළිත් සියතට ගැනීමට සමත් වූවාය. එහිදී ඇය තමන් එතෙක් වැටී සිටි වළෙන් ජ.වි.පෙ. සහායෙන් එගොඩව සුනාමි ප්‍රතිසංස්කරණ මණ්ඩලය හරහා ජ.වි.පෙ. ආණ්ඩුවෙන් පන්නා ගැනීමට වැඩ කටයුතු සම්පාදනය කළේය.

තමන් අසරණ වූ අවස්ථාවක ජ.වි.පෙ. කිට්ටු කර ගෙන එයට සහනයක් ලබා ගැනීමටත් තමන්ට පුළුවන් අවස්ථාවේ ජ.වි.පෙ. කනෙන් අල්ලා පැත්තට තල්ලු කර දැමීමටත් චන්ද්‍රිකා දේශපාලන වශයෙන් ඉතාමත් උපක්‍රමශීලී වූවාය. මෙම ක්‍රියාදාමය චන්ද්‍රිකා 1994 ජනාධිපතිවරණයේදී ද භාවිතා කළාය. එහිදී ඇය විධායක ජනාධිපති ක්‍රමය තමන් බලයට පත් වී වසරක් ඇතුළත අහෝසි කරන බවට ප්‍රතිඥාවක් දී ජ.වි.පෙ. ජනාධිපති අපේක්ෂක නිහාල් ගලප්පත්ති මහතාව ජනාධිපති සටනින් ඉවත් කිරීමට තරම් කාර්යශූර වූවාය.

### පොරොන්දු ඉෂ්ට නොකිරීම

එහෙත් ඇය වසරකින් නොව සිය ධූරයෙන් විශ්‍රාම යනතුරුවත් එම පොරොන්දු ඉෂ්ට කළේ නැත. අද දවසේද විධායක ජනාධිපති ධූරය නොනැසී එලෙසම පවතී. ඒ ගැන අද ජ.වි. පෙරමුණත් කතා කරන්නේ නැත.
එක් අතකට බලන කළ විධායක ජනාධිපති ක්‍රමය නොතිබුණා නම් 2004 දී ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩානායකට වසර දෙකක එ.ජා.ප. ආණ්ඩුව විසුරුවා හැර යළිත් බලයට පත්වීමට හැකියාව ලැබෙන්නේ නැත. එසේ වුණේ නම් අදටත් රටේ පාලන බලය උසුලන්නේ එ.ජා.ප. විසිනි.
එලෙස කල්පනා කරන විට හොඳට නරකට දෙකටම කට කිව්වා සේ හොඳට නරකට දෙකටම විධායක ජනාධිපති ක්‍රමය, භාවිත කරන පුද්ගලයාගේ ස්වරූපය හා ප්‍රතිපත්තිවල හොඳ නරක මත සියල්ල තීරණය වනු ඇත.
විධායක ජනාධිපති ධූරය නැමැති යක්ෂ තනතුර භාවිතා කර 2004 දී ජ.වි.පෙ. චන්ද්‍රිකා සුසංයෝගයෙන් සැදුම්ලත් සන්ධානය එ.ජා.පෙ. ආණ්ඩුව විසුරුවා හැර බලය තහවුරු කර නොගත්තේ නම් ජ.වි.පෙ.ට අදටත් පාර්ලිමේන්තුවේ ඇත්තේ මන්ත්‍රීධුර 16 ක් පමණි.
එපමණක් නොව මෙතෙක් කලක් එ.ජා.ප. ආණ්ඩුවක් බලයේ සිටියේ තම ජ.වි.පෙරමුණට ඉතාමත් නරක කල දසාවකට මුහුණ පෑමට සිදුවනු ඇත. මන්ද 88, 89 යුගයේ ඉතාමත් සුප්‍රසිද්ධ බටලන්ද වදකාගාරයේ චරිත එ.ජා.ප. ආණ්ඩුවේ ජීවමාන චරිත බවට පත් වී තිබුණ නිසාය.
ඒ අතින් බලන කල තමන්ගේ පරම සතුරා වූ විධායක ජනාධිපති ක්‍රමය නමැති යක්ෂයා එම අවස්ථාවේ ජ.වි.පෙ.ට පිහිට වූ බවක් පෙනේ.
එපමණක් නොව එම පානේ එළියෙන් චන්ද්‍රිකා ද එ.ජා.ප. කෙනෙහිලිකම්වලින් එතර වී සිය බලය ව්‍යාප්ත කර ගත්තාය.
කෙසේ වෙතත් මෙම කරුණු කාරණාවලින් පෙන්නුම් කරන්නේ 1994 සිට චන්ද්‍රිකා ජ.වි.පෙ. රවටා තමන්ට අවශ්‍ය වැඩ කොටසක් කරගෙන ඇති බවය. අද මහින්ද ජනාධිපතිවරයා ජ.වි.පෙ.ට කරන්නේත් ඒ දේමය.